ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ පවත්නා ආර්ථික අර්බුදය ජනතාවගේ මානසික තත්වයන්ටද අහිතකර ලෙසින් බලපා ඇති බව නොකිවමනායි. එවැනි තත්වයක් තුළ, අප සැම උත්සාහ කළ යුත්තේ හැකිතාක් දුරට එම මානසික පීඩනයන් සමනය කිරීමටත්, එම මානසික පීඩනය නැවත හැරවිය නොහැකි අන්දමේ කණගාටුදායක තීරණයන් වෙත යෑම වැළැක්වීමටත් දායකත්වය ලබාදීමයි. මෙම තත්වය හේතුවෙන් සිදුවන දිවි තොර කරගැනීමක් වාර්තා කරන්නේ කෙතරම් ප්‍රවේසමෙන්ද යන්න මාධ්‍ය තීරණය කළ යුත්තේ ද එම සමාජ වගකීම ඔස්සේයි.

පුද්ගලයෙකු තමන් සේවය කරන බේකරියේදී දිවි තොර කරගැනීමේ පුවතක් අරුණ පුවත්පත (ජූනි 15, 2022) සිය මුල් පිටුවේම වාර්තා කර තිබූ අතර, එයම දෙරණ අරුණ වැඩසටහන ඔස්සේ ද අවධානයට ලක් කෙරී තිබිණි.

මෙවැනි පුවත් වාර්තාවන් නිසි ප්‍රවේසමකින් වාර්තා කළ යුත්තේ කෙසේද යන්න, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් මඟින් පෙන්වා දේ.

1) දිවි තොර කරගැනීම් ප්‍රමුඛතාවයකින් තොරව පළ කරමු.

2) දිවි තොර කරගත් ආකාරය පළ නොකරමු.

3) දිවි තොර කරගැනීම් පිළිබඳ වාර්තාවන් සමඟින් උපකාරක අංක පළ කිරීමු.

අනුකාරක දිවි තොර කරගැනීම් අවම කිරීම සඳහා, දිවි තොර කරගැනීම් වගකීමකින් හා ආචාර ධාර්මික ප්‍රවේශයකින් වාර්තා කිරීමට සියළුම මාධ්‍ය උත්සුක විය යුතුයි.

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනි
හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://media.samaritans.org/.../Guidance_for_reporting...

https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...